# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

| 11 ශ්‍රේණිය | සිංහල සාහිත්‍ය සංග්‍රහය | ඒකකය 9 - උග්ගසේන නම් සිටුපුත්‍රයාගේ වස්තුව |
|---|---|---|

(1) පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

1) මෙම කතා වස්තුව අයත් මූලාශ්‍ර ග්‍රන්ථයේ නම සඳහන් කරන්න.
2) උග්ගසේන වස්තුව ඇතුළත් ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථය කුමක් ද?
3) එම ග්‍රන්ථයේ රචකයා කවුරුන් ද?
4) එම ග්‍රන්ථය ලියා ඇත්තේ කිනම් සාහිත්‍ය යුගයකදී ද?
5) මෙම ග්‍රන්ථ නාමයේ පද බිඳී ඇති අයුරු පෙන්වා දෙන්න.
6) ඒ සඳහා එම නම හිමි වීමට හේතුව ලියා දක්වන්න.
7) මෙම කතාව හා සම්බන්ධ බණ කතා රීතිය යන්නෙහි අදහස දක්වන්න.
8) අනුවර්තන හා පරිවර්තන කෘතියක් නොවන මෙම ග්‍රන්ථය කවර අවස්ථාවක් නියෝජනය කරන්නේද?
9) මෙම ධර්ම ග්‍රන්ථයේ භාෂා භාවිතය පිළිබඳ ඔබේ අදහස ලියා දක්වන්න.
10) භාෂාවට ජීව ගුණය ආරක්ෂා වන්නේ කිනම් භාෂා ලක්ෂණයෙන් ද?

(2) මෙම ප්‍රකාශනයන්හි අවස්ථා සම්බන්ධය ලියා දක්වන්න.

1) ''මා දුව විකුණන්නා නැත රන් හැරගෙන නොදෙමි''
2) ''ලදොත් ජීවත් වෙමි නො ලදොත් මියෙමි, සිතාගෙන නොකා නොබී හැදට වැටිලා වැද හොත්තාහ''
3) ''තොපි ගිය මැන, හුන මැනව, තොප කුමකුත් නොදන්නා තැනැත්තවුන්ගෙන් මට කම් කිමද''
4) ''මේ හැම මා අරභයා කියවුදැ'යි විචාළෝය.'' එසේය. අනික් කාට කියම් ද?''
5) මහණෙනි, මපුතුන් වැන්නවුන්ට භයෙක් කොයින් ද?''

(3) මෙම වචන වල අරුත් පැහැදිලි කරන්න.

| | | | |
|---|---|---|---|
| 1) සමණන්ට | 2) සිපිසේක | 3) වයොධාන්වාධික | 4) මුසුප්පුව |
| 5) කොක්සන් | 6) යාළුණු | 7) පයිඇදීමෙන් | 8) අවකප්පනය |
| 9) පිළිසිඹියා | 10) නටක විද්දතු | | |

(4) විචාර ප්‍රශ්නය

1) i) හාස්‍යය උපහාසය,

i) අනුකම්පාව මුසු කරමින්,

උග්ගසේන කතා වස්තුව නිර්මාණය කර ඇති අයුරු පැහැදිලි කරන්න.

(එකකට උදාහරණ දෙක බැගින් වචන 125 ක් සෑහේ.)